(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 159.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 ජුනි 25 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

27/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෑම ප්‍රාදේශීය සභාවක් සතුවම එහි දේපළ පිළිබඳ නිශ්චිත ලේඛනයක් තිබිය යුතු බවත්;

(ii) බොහෝ ප්‍රාදේශීය සභා සතුව එවැනි ලේඛනයක් නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

135/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මේ වනවිට වෙන් කර ඇති බංගලා හා නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් බංගලාව/නිල නිවාසය භාවිතා කරනු ලබන අමාත්‍යවරයාගේ/ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ/පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ/මහජන නියෝජිතයාගේ නම හා තනතුරු නාමය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මහජන නියෝජිතයන්ට වරප්‍රසාද/පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් විශාල සමාජ විරෝධයක් ඇතිවී තිබෙන අවස්ථාවක, මහජන නියෝජිතයන්ට ඒවා ලබා දීම සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1412/2025

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ මගී ප්‍රවාහන සේවාවේ නිරත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධ වන අයුරින් සේවා ක්‍රියාත්මක කළ යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම දිස්ත්‍රික්කයේ බස් රථ හා දුම්රිය සේවාව ඇතුළු පොදු ප්‍රවාහන සේවා අසතුටුදායක තත්ත්වයක පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1887/2026

ගරු අබූබකර් අතම්බාවා මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ වෙරළාශ්‍රිත ප්‍රදේශ කිහිපයක මුහුදු ඛාදනය හේතුවෙන් මහජන ක්‍රීඩාංගන සහ අභ්‍යන්තර මාර්ග ඇතුළුව විශාල භූමි ප්‍රමාණයක් විනාශවී ඇති බවත්;

(ii) එම ප්‍රදේශවල පිහිටි සුසාන භූමි මුහුදු ඛාදනයට ලක්ව මළ සිරුරු බාහිර පරිසරයට නිරාවරණය වීමේ තත්ත්වයක් මතුව ඇති බැවින් පදිංචිකරුවන්ට සමාජ සහ පාරිසරික ගැටලුවලට මුහුණදීමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රදේශවල තවදුරටත් මුහුදු ඛාදනය ඇතිවීම වැළැක්වීම සඳහා ගෙන ඇති හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂා කරන කෙටි කාලීන, දීර්ඝ කාලීන සහ ස්ථිර ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත සඳහන් කළ ස්ථාන විනාශවීම වැළැක්වීම සඳහා ගල් වැටි සහ ගල් බැම් වැනි වෙරළාරක්ෂක ඉදිකිරීම් සිදු කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1977/2026

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ක්‍රීඩා සඳහා ආබාධිත ක්‍රීඩකයන්ගේ සක්‍රිය සහභාගිත්වය වැඩිදියුණු කිරීමට ගනු ලබන පියවර;

(ii) ඒ සඳහා පාසල් සහ ජාතික මට්ටමින් සලසා ඇති ප්‍රවේශ පහසුකම් හා සහභාගිත්ව අවස්ථා;

(iii) එම ක්‍රීඩකයන්ට අවශ්‍ය උපකරණ ලබාදීමට සහ ක්‍රීඩාංගනවල ප්‍රවේශ පහසුකම් තහවුරු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂයේ ආබාධිත ක්‍රීඩකයන් සහභාගීවූ ජාතික මට්ටමේ තරඟ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ක්‍රීඩකයන්ගේ ජයග්‍රහණවල ප්‍රගතිය කවරේද;

(iii) කලාප, පළාත් හා ජාතික මට්ටමින් තරඟ සඳහා යොමු කිරීමේදී සාධාරණ සහ සමාන ප්‍රවේශයක් සහතික කිරීම පිණිසවූ නිර්ණායක ක්‍රියාත්මක වන්නේද;

(iv) එසේ නම්, එම නිර්ණායක කවරේද;

(v) ඔවුන්ගේ දක්ෂතා හඳුනාගෙන ජාත්‍යන්තර තරඟ සඳහා යොමු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආබාධිත ක්‍රීඩකයන්ගේ කුසලතා ප්‍රවර්ධනය සඳහා ප්‍රවීණ පුහුණුකරුවන් සහ ක්‍රීඩා උපදේශකවරුන් යොමු කර තිබේද;

(ii) එම ක්‍රීඩකයන් සඳහා විශේෂයෙන් සංවිධානය කරන ලද තරඟ තිබේද;

(iii) එසේ නම්, එම තරඟ සංවිධානය කරනු ලබන ආයතන කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2011/2026

ගරු දේවානන්ද සුරවීර මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 වර්ෂය තුළ කොළඹ දිස්ත්‍රික්කයේ ත්‍රිරෝද රථ මගී ප්‍රවාහනය, පාසල් දරුවන් ප්‍රවාහනය කිරීම සහ කාර්යාලයීය කාර්ය මණ්ඩල ප්‍රවාහනය කිරීම ජීවනෝපාය ලෙස සිදු කරන පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රවාහන සේවා ආශ්‍රිතව, 2025 වර්ෂයේ කොළඹ දිස්ත්‍රික්කය තුළ උත්පාදනයවී ඇති අවිධිමත් රැකියා අවස්ථා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් රැකියා ක්ෂේත්‍රවල නියැලී සිටින පුද්ගලයන් සඳහා නෛතික ආරක්ෂාව ලබාදීම, හිමිකම් සුරක්ෂිත කිරීම සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීම තුළින් ඵලදායි පුරවැසියන් ලෙස සංවර්ධනය කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) නොඑසේ නම්, ගැනීමට අපේක්ෂිත ඉදිරි පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2034/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිට්වා සුළිකුණාටුවට පෙර රත්නපුර දිස්ත්‍රික්කයේ නාය යාමේ අධි අවදානම් කලාපවලින් ඉවත් කළ පවුල් සඳහා ස්ථාපිත කරන ලද ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල ඉඩම් කැබලි ලැබුණු නමුත් නිවාස ඉදිකිරීම සඳහා ලබාදෙන රුපියල් 1,600,000 මුදල නොලැබුණු පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) මුදල් නොලැබුණු පුද්ගලයන් වෙනුවෙන් මුදල් ලබා දෙන දිනය කවරේද;

(iv) පිහිටුවා ඇති ගම්මානවල මාර්ග, ජල, විදුලිය සහ අපද්‍රව්‍ය බැහැර කිරීම වැනි පහසුකම් සම්බන්ධ ගැටලු විසඳීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2037/2026

ගරු සුජීව දිසානායක මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීමේ අරමුණු ඉටුවී තිබේද;

(ii) වාරියපොල ප්‍රදේශය තුළ ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටුවා ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එය ඉදිකිරීම සඳහා වැයවූ මුදල කොපමණද;

(iv) එම මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක වන ආයතන කවරේද;

(v) මේ වනවිට එම මධ්‍යස්ථානයෙන් රජයට ලැබී ඇති ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2040/2026

ගරු වරුණ ලියනගේ මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ සමූපකාර සමිති මඟින් පාලනය වන ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉන්ධන පිරවුම්හල් මඟින් අලෙවි කරනු ලබන ඉන්ධන සඳහා ඛනිජ තෙල් සංස්ථාව මඟින් කොමිස් මුදලක් ගෙවනු ලබන්නේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) ඉන්ධන සඳහා ගැනුම් මිලට අදාළ වැට් බද්ද ගෙවනු ලබන පාර්ශ්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමූපකාර සමිතිවලට ගැනුම් මිල හා විකුණුම් මිල අතර වෙනසට අදාළව වැට් බද්ද ගෙවීමට සිදුව ඇති බව දන්නේද;

(ii) ඒ හේතුවෙන් සමූපකාර ඉන්ධන පිරවුම්හල් ලාභ ලැබීමට නොහැකිව වැසී යාමේ අවදානමක් මතුවී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම පිරවුම්හල් පවත්වාගෙන යාම සඳහා සහනදායි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2051/2026

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ, මේ වනවිට ඇති වතු සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව;

(ii) ඒ අතරින් රජයට පවරා ගෙන ඇති වතු සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව;

(iii) ඉදිරියේදී රජයට පවරා ගැනීමට නියමිත වතු සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

"ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියමය,— 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 1(2) වගන්තිය යටතේ එවකට බලශක්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 05 දිනැති අංක 2478/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුරාවස්තු ආඥාපනත යටතේ නියෝග,— (188 අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු 47 වගන්තිය යටතේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2026 අප්‍රේල් 11 දින සාදන ලදුව, 2026 ජූනි 12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*9.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

12.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

13.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

14.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

15.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

890/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කොරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා කාලවකවානුව තුළ රජයේ 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

891/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

892/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ එම පුද්ගලයන්ට 'උරුමය' සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් ඇතැම් පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?